කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර zonal Education Office – Kalutara வலயக்கல்விக் காரியாலயம் களுத்துறை කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

# මධ්‍ය වාර පරීක්ෂණය - 2018

10 ශ්‍රේණිය

## නර්තනය I පත්‍රය

කාලය පැය යි

- **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන තෝරන්න**

1). පා සරඹ, මණ්ඩි පද නිවැරදිව අභ්‍යාස කිරීමෙන් ................................. සකස් කර ගත හැකිය.

(1).දණ්ඩියම. (2).දණ්ඩිකද. (3).මණ්ඩිය. (4).ඔඩිය.

2). "සොබමන් දෙව්වරු සදෙනෙක් එතැනට මෙය .............................................. කවියකි.

(1).ගොයම්. (2).පැල්. (3).රබන්. (4).වාමර.

3). 2 + 2 + 3 තිත් රූපය .......................................... ලෙස හඳුන්වයි.

(1)දෙසුළු මහ තුන්තිත. (2).දෙසුළු මැදුම් තුන්තිත.
(3).දෙමැදුම් මහ තුන්තිත. (4).දෙමැදුම් සුළු තුන්තිත.

4). ගුරුහාමි .................................. නාටකයේ එන ප්‍රධාන චරිතයකි.

(1). සොකරි (2).කෝළම් (3).නාඩගම් (4).කරදිය

5). 'හනික වරෙවු කොල්ලනේ මෙන්න මෙහෙ වරෙවු' ගීතය ඇතුළත් නාට්‍ය වන්නේ ........... යි.

(1). කුඹි කතාව නාට්‍යය. (2). බෙරහඬ නාට්‍යය.
(3). සොකරි නාට්‍යය. (4). කෝළම් නාට්‍යය.

6). වේදිකා නර්තන අංගයක් සඳහා භාවිතා කරනුයේ ....................... අංග රචනයකි.

(1). ශෛලීගත (2)හාස්‍යරූපී (3). විකාර රූපී (4). සරල

7). දරුවෙකුගේ මානසික ස්වස්ථතාව කෙරෙහි බලපාන සාධක ප්‍රධාන වශයෙන් කොටස් ..... කි.

(1). දෙකකි. (2). තුනකි. (3). හතරකි. (4). හයකි.

8). 'රටකට මව් සමගින් ඒ නැව් නැගී' මෙම කවිය ....................... නර්තනයට අයත් වේ.

(1). පන්තේරු (2). වාමර (3). රබන් (4). කුළු

9). වේදිකා නාට්‍ය ශිල්පියෙකු සතුව තිබිය යුතු දක්ෂතාවක් විය යුත්තේ ............................... ය.

(1). ගායන කුසලතාව (2). නර්තන කුසලතාව
(3). භාව ප්‍රකාශන කුසලතාව (4). ඉහත සියල්ලම.

10). නොඇදන අකුරු නැතහොත් තනි අකුරු හඳුන්වන්නේ,

(1). ලඝු අක්ෂර වශයෙනි. (2). ගුරු අක්ෂර වශයෙනි.
(3). ප්ලුත අක්ෂර වශයෙනි. (4). මාත්‍රා යනුවෙනි.

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු වරණය තුළින් තෝරන්න.**

11). ජීවන වෘත්තියක් තේමා කරගත් නර්තන නිර්මාණයකි,

(1). කොහු, කෘෂි, ඔන්චිලි, රබන්
(2). මැටි, ධීවර, කෘෂි, තේ
(3). කොහු, මැටි, පතුරු, වේවැල්
(4). කෘෂි, කුඹල්, ධීවර, වන්නම්.

12). ලය ප්‍රභේද අනුව විලම්භ ලයෙහි සිව් ගුණය වන්නේ,

(1). අති විලම්භ ලයයි. (2). ද්‍රැත ලයයි.
(3). මධ්‍ය ලයයි. (4). අති ද්‍රැත ලයයි.

13). කුඹී කතාව මුද්‍රා නාට්‍යයේ රංග වස්ත්‍රාභරණ සහ පසුතල නිර්මාණය කරන ලද්දේ,

(1). මහේෂ් උමගිලිය මහතා විසිනි. (2). වජිරා චිත්‍රසේන මහත්මිය විසිනි.
(3). සෝමබන්දු විද්‍යාපති මහතා විසිනි. (4). අංජලිකා මහත්මිය විසිනි.

14). 'ජීවිතත් මුහුද වගේ ඉමක් නැතේ කොනක් නැතේ' මෙම ගීත ඛාණ්ඩය ඇතුලත් මුද්‍රා නාට්‍යය,

(1). ධීවරයෝ (2). කරදිය
(3). කැළණි පාලම (4). මුහුදු ළිහිණියෝ

15). තාලයේ වේග තුන මෙනමින් හැදින්වේ,

(1). දෙගුණ, සිව්ගුණ, සයගුණ වශයෙනි.
(2). සමගුණ, තුන්ගුණ, සිව්ගුණ වශයෙනි.
(3). සමගුණ, දෙගුණ, සිව්ගුණ වශයෙනි.
(4). සමගුණ, දෙගුණ, තුන්ගුණ වශයෙනි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව | D තීරුව |
|---|---|---|---|---|
| 1 | ස්පිල් බර්ජන් | මහාවංශය | මහා පරාක්‍රමබාහු රජු | දීපවංශය |
| 2 | නිශ්ශංකමල්ල රජු | විදේශියන් දුටු පුරාණ ලංකාව | ගම්පළ යුගය | ඩේවි |
| 3 | එදා හෙළදිව | පොළොන්නරු යුගය | පාහියන් භික්ෂුවගේ වාර්තාව | 6වන පරාක්‍රමබාහු රජු |
| 4 | අනුරාධපුර යුගය | රොබට් නොක්ස් | ඉබන් බතූතා | සමන්ත පාසාදිකාව |
| 5 | චූලවංශය | දුටුගැමුණු | ථූපවංශය | මහනුවර යුගය |

16). පොළොන්නරු යුගයේ සරස්වති මණ්ඩපය ඉදිකොට නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය දැක්වූ රජු ඇතුළත් වන්නේ,

(1). A තීරුවේ 2 පේළියේය. (2). B තීරුවේ 4 පේළියේය.
(3). C තීරුවේ 1 පේළියේය. (4). D තීරුවේ 3 පේළියේය.

17). රොබට් නොක්ස්ගේ වාර්තාව ඇතුළත් ග්‍රන්ථය දැක්වෙන්නේ,

(1). A තීරුවේ 3 පේළියේය. (2). B තීරුවේ 2 පේළියේය.
(3). C තීරුවේ 3 පේළියේය. (4). D තීරුවේ 4 පේළියේය.

18).දුටුගැමුණු රජු නළඟනන් පිරිවරා රුවන්වැලි සෑ ධාතු නිධාන උත්සවයට ගිය බව සඳහන් වන මූලාශ්‍රය දැක්වෙන්නේ,

(1). A තීරුවේ 5 පේළියේය. (2). B තීරුවේ 1 පේළියේය.
(3). C තීරුවේ 5 පේළියේය. (4). D තීරුවේ 1 පේළියේය.

19). ඉබන් බතූතාගේ දේශාටන වාර්තාව අයත් වන යුගය දැක්වෙන්නේ,

(1). A තීරුවේ 4 පේළියේය. (2). B තීරුවේ 3 පේළියේය.

(3). C තීරුවේ 2 පේළියේය. (4). D තීරුවේ 5 පේළියේය.

20). 'මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටති' මෙය ඇතුළත් දේශාටන වාර්තාව හා සම්බන්ධ වාර්තාකරු දැක්වෙන්නේ,

(1). A තීරුවේ 1 පේළියේය. (2). B තීරුවේ 2 පේළියේය.

(3). C තීරුවේ 3 පේළියේය. (4). D තීරුවේ 2 පේළියේය.

- අංක 21 සිට 26 තෙක් ප්‍රශ්න වලට පහත රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


A


B


C

21). ඉහත A රූපයේ දැක්වෙන වාද්‍ය භාණ්ඩ වන්නේ,

(1). තම්මැට්ටම, පහතරට බෙරය, හොරණෑව

(2). හොරණෑව, ගැට බෙරය, තම්මැට්ටම.

(3). තම්මැට්ටම, දවුල, හොරණෑව.

(4). තම්මැට්ටම, දවුල, හක්ගෙඩිය.

22). B රූපයේ දැක්වෙන්නේ අතීතයේ සන්නිවේදන කාර්යය සඳහා වාද්‍ය භාණ්ඩ යොදාගත් අවස්ථාවකි. එය,

(1). තේවා වාදනයකි. (2). මළබෙර වාදනයකි.

(3). අණ බෙර වාදනයකි. (4). වද බෙර වාදනයකි.

23). ඉහත C රූපයෙන් දැක්වෙන වාදන අවස්ථාව,

(1). ශාන්ති කර්මයකි. (2). පෙරහරකි.

(3). තේවා වාදයකි. (4). හේවිසි වාදනයකි.

24). C රූපය කුමන නර්තන සම්ප්‍රධායට අයත් වුවක්ද?

(1). උඩරට නර්තන සම්ප්‍රදායට. (2). පහතරට නර්තන සම්ප්‍රදායට.

(3). සබරගමු නර්තන සම්ප්‍රදායට. (4). ගැමි නර්තනයකට.

25). ඉහත A, B, C රූපවල ඇතුළත් භාණ්ඩ පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයේ,

(1). ආතත, විතත, විතතාත, ඝන භාණ්ඩ වලට අයත් ය.

(2). ආතත, විතතාත,ඝන, සුසිර භාණ්ඩ වලට අයත් ය.

(3). ආතත, විතත, විතතාත, සුසිර භාණ්ඩ වලට අයත් ය.

(3). ආතත, විතත, විතතාත, ඝන, සුසිර භාණ්ඩ වලට අයත් ය.

26). අංග රචනය අයත් වන්නේ සතර අභිනයෙන්,

(1). ආහාර්ය අභිනයටය. (2).වාචික අභිනයටය.

(3). ආංගික අභිනයටය (4). සාත්වික අභිනයටය.

10 ශ්‍රේණියේ නර්තන විෂයය හදාරන සිසුන් සිව් දෙනෙකු විසින් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු දුන් ආකාරය පහත දැක්වේ. ඒ ඇසුරින් 27 සිට 30 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ප්‍රශ්නය:- 1. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ගැමි නාටකය කුමක්ද?

2. එම ගැමි නාටකයේ එන චරිත 4 ක් නම් කරන්න.

3. සොකරි ගැමි නාටකයේ වෙස්මුහුණු නිර්මාණය සඳහා යොදා ගත් අමුද්‍රව්‍යයක් දක්වන්න.

4. සොකරි ගැමි නාටකයේ රංග භූමිය හඳුන්වන්නේ කුමන නමකින්ද?

| පිළිතුරු | 1 ප්‍රශ්නය | 2 ප්‍රශ්නය | 3 ප්‍රශ්නය | 4 ප්‍රශ්නය |
|---|---|---|---|---|
| පවනි | සොකරි | පරයා/ සොකරි/ ගුරු හාමි/ වෙදරාළ | කොළපත් | කමත |
| දසුනි | කෝළම් | සොකරි/ ගුරුහාමි/ වෙදරාළ/ පරයා | කදුරු ලී | කමත |
| කසුනි | සොකරි | ජසයා/ පරයා/ වෙදරාල/ නොංචි | කාඩ්බෝඩ් | තානායම් පොළ |
| උවිනි | රූකඩ | ලෙන්චිනා/ ජසයා/ පරයා/ සොකරි | හාඩ්බෝඩ් | කරළිය |

27). වැඩිම නිවැරදි පිළිතුරු සංඛ්‍යාවක් ලබා දී ඇත්තේ කවුරුන් විසින්ද?

(1). පවනි (2). දසුනි (3). කසුනි (4). උවිනි

28). දෙවන ප්‍රශ්නය සඳහා කසුනි දුන් වැරදි චරිත වන්නේ,

(1). ජසයා සහ වෙදරාළ (2). වෙදරාළ සහ නොංචි

(3). ජසයා සහ නොංචි (4). නොංචි සහ පරයා

29). අඩුම ලකුණු ලබා ගත්තේ කවුරුන් විසින්ද?

(1). පවනි (2). උවිනි (3). කසුනි (4). දසුනි

30). දසුනිට වඩා පවනිගේ නිවැරදි පිළිතුරු සංඛ්‍යාව කීයද?

(1). 3 යි. (2). 4 යි. (3). 1 යි. (4). 2 යි.

## උඩරට නර්තන සම්ප්‍රදාය.

31). එකළොස්වන ගොඩ සරඹයේ සරඹ නාමය වන්නේ,

(1). බඹර සරඹයයි. (2). පැනීමේ සරඹයයි.

(3). චන්ද්‍රිකා සරඹයයි (4). අර්ධ චක්‍ර සරඹයයි.

32). 'තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම්' යනු,

(1). 11 පා සරඹයයි. (2). 10 වන පා සරඹයයි.

(3). 12 වන පා සරඹයයි. (4). 9 වන පා සරඹයයි.

33). 'සුරිඳුන් පෙර සිටන් බලයුත් සවති දුන්' මෙහි දෙවන පාදය වන්නේ,

(1). අසුරන් කළ යුදෙන් - ජය ගෙන කඳ කුමරුන්

(2). බර අත් ගෙන කඟින් - ඇන කොන් කව් වලින්

(3). ගසමින් කඟපතින් - දෙපලුව අසුර සෙන්

(4). සහගොස් කළ යුදෙන් - අසුරන් ජය නොලදින්

34). දොං ජිංත ගත දොංත වට්ටම අයත් තාලරූපය වන්නේ,

(1). මාත්‍රා 3 + 4 තාලරූපය (2). මාත්‍රා 2 + 4 තාලරූපය

(3). මාත්‍රා 2 + 3 තාලරූපය (4). මාත්‍රා 3 + 3 තාලරූපය

35). උඩරට බෙර වාදනයට අයත් සතර බීජාක්ෂර නම්,

(1). තත්, ජිත්, තොං, නං (2). තත්, කිට, දොං, නං

(3). තත්, තත්, ජිත්, ජිත් (4). තත්, දිත්, දොං, නං

36). 'ජෙන් තත් තත් ජෙන් තත් තත්' මෙය නර්තනය කෙරෙන තාල රූපය නම්,

(1). මැදුම් මහ දෙතිත. (2). සුළු මහ දෙතිත.

(3). සුළු මැදුම් දෙතිත. (4). මැදුම් තන් තිත.

37). මේවා උඩරට නර්තනයේ දී පමණක් භාවිතා වන වචන වේ.

(1). කස්තිරම, සීරුමාරුව. (2). මණ්ඩිය, අඩව්ව

(3). මාත්‍රා පහ, සීරුමාරුව (4). සරඹ පද සහ සීරුමාරුව

38). ගැට බෙරය වාදනයේ දී පමණක් යෙදෙන බෙර පදයකි.

(1). ජෙනකිට කිටිතක ගුඳත් (2). රුදකිට ගත දොං රෙගතත්

(3). දොං ත තහුරු ගුද ගත් (4). දොං දොං ජිං ජිං ගජිගත

39). මාත්‍රා 1 2/ 1 2 3 4 සහ මාත්‍රා 1 2 3 4 / 1 2 3 4 තාල රූපවලට අයත් වන්නම් දෙකකි.

(1). වෛරොඩි/ තුරඟා (2). සැවුලා/ නෛයඩි

(3). සැවුලා/ සිංහරාජ (4). තුරඟා/ වෛරොඩි

40). උඩරට වන්නමක ව්‍යුහය කොටස් ......................................... කි.

(1). 5 කි. (2). 4 කි. (3). 6 කි. (4). 3 කි.

## පහතරට නර්තන සම්ප්‍රදාය

31). එකළොස්වන ඉලංගම් සරඹයේ සරඹ පදය වන්නේ,

(1). ගුහිති ගදිරිකිට ගුඳ ගුඳ ගුම් දිත් තා

(2). ඊ ... රිම් දහිං රෙගදිත ගත ගුඳ ගත්තම්

(3). දොංත ගදිත ගත ගත් දැහැම්

(4). ගුම් දැහිං // ගත්තත් දොං දිතගත

32). ‘තෙයියත් කිටිතක - ගුහිති ගදිරිකිට’ මෙය ,

(1). 11 වන පා සරඹයයි.

(2). 10 වන පා සරඹයයි.

(3). 9 වන පා සරඹයයි.

(4). 8 වන පා සරඹයයි.

33). ‘සඳ සන්දර නව මන්තර අදහා ගත් ලෙසටා’ මෙහි ඉතිරි පාදය වන්නේ,

(1). සඳ සන්දර දිගු පුන් දිළිමන් ඔබ යසටා

(2). සඳ සන්දර පැරදුන මෙන් සැඟ වී මෙර ගිරටා

(3). සඳ සන්දර දිළිමන්දර පැරදුන මෙන් යසටා

(4). සඳ සන්දර පතිවල්ලභ සෙත්දෙන් සව් සතටා

34). ගුඳ ගති ගත වට්ටම අයත් තාල රූපය වන්නේ,

(1). මාත්‍රා 3 තනි තිත. (2). මාත්‍රා 2 + 3 දෙතිතේ තාලරූපය

(3). මාත්‍රා 2 තනි තිත (4). මාත්‍රා 3 + 4 දෙතිතේ තාල රූපය

35). පහතරට බෙර වාදනයට අයත් සතර බීජාක්ෂර නම්,

(1). තත් දිත් තොං නං

(2). තත් තත් දිත් දිත්

(3). තත් ජිත් තොං නං

(4). තත් තකට තොං නං

36). ‘දොම් තත් දිම් ගත ගුගු දිත ගත්’ .... මෙය නර්තනය කෙරෙහි තාල රූපය වන්නේ,

(1). සුළු මැදුම් දෙතිත (2). සුළු මහ දෙතිත.

(3). මැදුම් මහ දෙතිත. (4). මුදුම් තනි තිත.

37). මේවා පහතරට නර්තනයේ දී පමණක් භාවිතා වන වචන වේ.

(1). ඉරට්ටිය, අන්තාඩිය (2). මණ්ඩිය, සුරල

(3). ඉරට්ටිය, අඩව්ව (4). සුරල, කස්තිරම

38). පහතරට බෙර වාදනයේ දී පමණක් යොදන බෙර පදයකි.

(1). දොං ගුද ජිං ගත (2). දොං දොං ගත ජිං ගජිගත

(3). ජිම්කිට කිටිතක තරිකිට (4). ගුංද ගත්ගත ගත්ත ගුංගුද

39). මාත්‍රා 1 2 / 1 2 3 4 සහ මාත්‍රා 1 2 3 4 / 1 2 3 4 තාල රූප වලට අයත් වන්නම් දෙකකි.

(1). අනුරාග දණ්ඩ තාලය සහ ශුද්ධ තාලය

(2). අනුරාග දණ්ඩ තාලය සහ නාතිලිංචි තාලය

(3). හනුමන්තා තාලය සහ නාතිලිංචි තාලය.

(4). ශුද්ධ තාලය සහ නාතිලිංචි තාලය

40). පහතරට වන්නමක ව්‍යුහය කොටස් ........... කි.

(1). 5 කි. (2). 6 කි. (3). 4 කි. (4) 3 කි.

කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

මධ්‍ය වාර පරීක්ෂණය - 2018

10 ශ්‍රේණිය | නර්තනය II පත්‍රය | කාලය පැය යි

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුළත් ව ප්‍රශ්න 05 ට පමණක් පිළිතුරු ලියන්න.**

(1). උඩරට නර්තනය සම්ප්‍රදායේ කස්තිරමට සමාන පහතරට නර්තන සම්ප්‍රදායේ ................................................ නටනු ලැබේ.

(2). තාලම්පටින් නිපදවිය හැකි ශබ්ද දෙක .................................................... සහ ............................................. යනුවෙන් හැඳින්විය හැක.

(3). 'පද අල්ලන්නේ පියයුරු ලැම සොලවන්නී' කවිය ......................................................ගැමි නාටකයට අයත්ය.

(4). චාමර නැටුම සඳහා චාමර කවි මෙන්ම .................................................. කවි ද භාවිතයට ගැනේ.

(5). හේවිසි වාදනයේ දී දවුල හා තම්මැට්ටම සඳහා යොදා ගනු ලබන සුසිර භාණ්ඩය වන්නේ ...............................

.................................. යි.

(6). දෙවින්දර දේවාලය ඉදිරිපිට හින්දු බාලිකාවන් පන්සියක් නර්තනයේ යෙදුණු බව .......................................... සඳහන් වේ.

(7). අංග රචනයක් ආරම්භයේදී ප්‍රථමයෙන්ම ආලේප කරනු ලබන්නේ ......................................... ආලේපයයි.

(8). 'අට දෙන අට කොන වාඩිවෙයල්ලා' ......................................................... කි.

(9). කරදිය මුද්‍රා නාට්‍ය ........................................................ දශකයේ .......................................... මහතා විසින් නිර්මාණය කරන ලද්දකි.

(10). සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශ 02 ක් නම් කරන්න.

..................................................................................................

..................................................................................................

(2).

i. ඔබ ප්‍රදේශයේ පවත්නා ජීවන වෘත්තින් 04 ක නම් කරන්න. (ලකුණු 02)

ii. ඉන් එක් වෘත්තියක ක්‍රියාකාරකම් පෙළ ගස්වන්න. (ලකුණු 04)

iii. එම ක්‍රියාකාරකම් වල සුවිශේෂී ලක්ෂණ පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 06)

(3)

i. නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු අනාවරණය කර ගත හැකි මූලාශ්‍ර 04 ක් නම් කරන්න. .
(ලකුණු 02)

ii. නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බවට මහා වංශය හා චූලවංශය ඇසුරින් විමසන්න. (ලකුණු 04)

iii. මහනුවර යුගයේ නර්තන කලාව පිළිබඳ දේශාටන වාර්තාවක් ඇසුරින් විමසන්න. (ලකුණු 06)

(4).

i. ස්වස්ථතාව යන්න කෙටියෙන් හඳුන්වන්න. . (ලකුණු 02)

ii. නර්තන ක්‍රියාකාරකම් තුළින් ඔබ තුළ වර්ධනය වන හැකියා 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. සාර්ථක දිවිපෙවතක් ගත කිරීමට නර්තනය හැදෑරීමේ වැදගත්කම පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

(ලකුණු 06)

(5).










i.ඉහත A රූපයේ දැක්වෙන නර්තන අංගය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06)

ii.B රූපයේ නර්තනය සඳහා යොදා ගත හැකි කවියක් ලියන්න (ලකුණු 06)

iii.C රූපයේ දැක්වෙන මුද්‍රා නාට්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06)

(6).

i. අංග රචනයක් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06)

ii. අංග රචනය සඳහා යොදා ගැනෙන ආලේපන වර්ග සහ උපකරණ 04 බැගින් නම් කරන්න. (ලකුණු 06)

iii. අංග රචනය කිරීමෙන් ඇති ප්‍රයෝජන 04 ක් විස්තර කරන්න. (ලකුණු 06)

(7).

i. සන්නිවේදන කාර්යය සඳහා යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ 04 ක් නම් කරන්න. (ලකුණු 06)

ii. අතීතයේ දී ආගමික හා රාජ්‍ය පාලන කටයුතු සඳහා වාද්‍ය භාණ්ඩ භාවිතා කළ අවස්ථා 2ක් බැගින් නම් කරන්න. (ලකුණු 06)

iii. වර්තමානයේ ආගමික, සමාජීය හා සංස්කෘතික උත්සව සඳහා වාද්‍ය භාණ්ඩ යොදා ගන්නා අවස්ථා 04 ක් නම් කොට මෙම වාද්‍ය අංග සංරක්ෂණය සඳහා සුදුසු යෝජනා 04 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු 06)